# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,270 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 362 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 365 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මාර්තු මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


361 B 82321— 403 (2022/03)
A 1-

# රජයේ නිවේදන

**අධ්‍යාපන අමාත්‍යාංශය**

මගේ අංකය : ඊඩී/1/8/4/කො/ද්වි/සීල/15.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වැනි වගන්තිය යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ) යටත් ව බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන කාර්ය සඳහා නිවේදනය**

පාදුක්ක, සේනානායක පෙදෙස, මාතිකමාතා ආරාමයේ කො/ශ්‍රී චන්ද්‍රෝදය ද්විභාෂා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනය පිහිටුවීමටත් එම ද්විභාෂා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනය 2020.11.09 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කර දෙන ලෙසත් ආරාමාධිපතිනි ගරු පාදුක්කේ සුමිත්‍රා සිල් මැණියන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී ඇත. එබැවින් එකී ද්විභාෂා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතනය විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03(06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදිය වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30ක්) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

2022 පෙබරවාරි මස 23 වැනි දින.

03-43

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/49/2022/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි II වැනි තීරුවේ සඳහන් ඉඩම් සහ III වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ I වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2022.03.04 වැනි දින සිට 2022.03.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.03.25 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දෙහිවල කොට්ඨාසයේ 59 වෙළුමේ 17, 18 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, දෙහිවල ගල්කිස්සේ හි පිහිටි 'අළුත්වත්ත *හෙවත්* ඇලබඩවත්ත' නමැති ඉඩමට මායිම්,<br><br>උතුරට : බී 19 (පාරකට වෙන් කළ කොටස),<br>නැගෙනහිරට : බී 04,<br>දකුණට : 04 එම් 01,<br>බස්නාහිරට : දුම්රිය පාර සඳහා වෙන් කළ බිම් තීරය.<br><br>බිම් ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 25.06. | 01. එච්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.03.14 දින ලියා සහතික කරන ලද අංක 752 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. එච්. ජයවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2004.10.11 දින ලියා සහතික කරන ලද අංක 50 දරන විකුණුම් ඔප්පුව.<br><br>03. ඒ. ඒ. එච්. ඩබ්ලිව්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.12.20 දින ලියා සහතික කරන ලද අංක 3818 දරන විකුණුම් ඔප්පුව.<br><br>04. ඩබ්. ඒ. ඩබ්. ඩී. වැලිඅංග ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2014.04.25 දින ලියා සහතික කරන ලද අංක 831 දරන උකස් ඔප්පුව. |

03 - 44

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/86/2021/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි II වැනි තීරුවේ සඳහන් ඉඩම් සහ III වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ I වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2022.03.04 වැනි දින සිට 2022.03.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.03.25 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
| --- | --- | --- |
| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ කොට්ඨාසයේ 143 වෙළුමේ 164 පත්‍රිරුව. | වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 200 - පහළ බළල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහව ප්‍රා.ස. පළාත් පාලන ආයතනයෙ හි වන්නිහත් පත්තුවේ කටුවන්නා හි කෝරළේ කඩවලේ පිහිටි "පාලම ගාව හේන, ඇළ ගාව හේන" නැමති ඉඩමේ මායිම්,<br><br>උතුරට : හීන් ඇළට වෙන් කළ බිම් කොටස,<br>නැගෙනහිරට : හීන් ඇළට වෙන් කළ බිම් කොටස,<br>දකුණට : කැබලි අංක 28,<br>බස්නාහිරට : පාර.<br><br>බිම් ප්‍රමාණය : අ. 01, රූ. 03, පර්. 11. | 01. ආර්. බී. බළල්ල ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1940.07.14 දින ලියා සහතික කරන ලද අංක 1713 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. ආර්. බී. බළල්ල ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1941.04.27 දින ලියා සහතික කරන ලද අංක 1825 දරන විකුණුම් ඔප්පුව.<br><br>03. අග්‍රාණ්ඩුකාරතුමා විසින් 1936.06.06 දින දරන විකුණුම් ඔප්පුව.<br><br>04. ඩී. බී. වෙලගෙදර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1971.12.18 දින ලියා සහතික කරන ලද අංක 2365 දරන තෑගි ඔප්පුව. |

03 - 66

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/58/2021/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි II වැනි තීරුවේ සඳහන් ඉඩම් සහ III වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ I වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2022.03.04 වැනි දින සිට 2022.03.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.03.25 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,<br>
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,<br>
අංක 234/ඒ3,<br>
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
බත්තරමුල්ල.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ කොට්ඨාසයේ 307 වෙළුමේ 125 පත්‍රිරුව. | උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත පත්තුවේ, කනදරා කෝරළේ, අනුරාධපුර නගරයේ, පළමුවන පියවරේ බැංකු පෙදෙසේ නගර සභා නිවාස 15 - ග්‍රා.නි. - 14 ඒ නුවර වැව පිහිටි බලයලත් මානක අනුරාධපුර නගර සභාවේ වැඩ අධිකාරී එස්. විජේරත්න මහතා විසින් මැන සාදන ලද අංක යූ. සී. 01-1979- නොවැම්බර් 22 දිනැති පිඹුරේ ලොට් 15 සඳහා මායිම්,<br><br>උතුරට : කැබලි අංක 16,<br>නැගෙනහිරට : පාර,<br>දකුණට : කැබලි අංක 14,<br>බස්නාහිරට : කැබලි අංක 13, කැබලි අංක 12.<br><br>බිම් ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 12.06. | 01. දොන් පියසේන කරුණාරත්න විශේෂ කොමසාරිස් විසින් 1979.12.14 දින ලියා සහතික කරන ලද අංක 09 දරන විකුණුම් ඔප්පුව. |

03 - 67

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කොරල් සැෆ්රොන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0086 1000 2081

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020.11.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 114 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2016 මැයි 25 දාතම හා අංක 623 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක PV 108730 දරන සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගත කොට ඇති සමාගමක් වන කොරල් සැෆ්රොන් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 623 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් හය කෝටි හැට දෙලක්ෂ අට දහස් තුන්සිය විසි පහයි ශත හතක (රු. 466,208,325.07) මුදලක් 2020 නොවැම්බර් 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් හය කෝටි හැට දෙලක්ෂ අට දහස් තුන්සිය විසි පහයි ශත හතක (රු. 466,208,325.07) මුදලද, 2020 නොවැම්බර් 12 දින සිට අංක 623 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් අට කෝටි දහතුන් ලක්ෂයක (රු. 381,300,000.00) මුදලක් සඳහා at the rate of Average weighted Prime Lending rate + Two Decimal Five per centum (AWPLR + 2.5%) per annum හා තවත් රුපියල් දෙකෝටි හැත්තෑ හය ලක්ෂයක (රු. 27,600,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) බැගින් වූ පොළිය ද,

දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 623 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, මෝදර වෝඩ් අංක 02, මෝදර අලුත් මාවත පාරේ පිහිටි අලුත් මාවත පාර, වරිපනම් අංක 626 දරන ඉඩමට බලයලත් මානක තැන කේ. සෙල්වරත්නම් යන අය විසින් සාදන ලද 2004 සැප්තැම්බර් 27 දාතම හා අංක 10463 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් XA වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්:- ඊසානට : ගමන් මාර්ගය (අඩි 3 පළල) (මීටර් 0.9 පළල), ගිණිකොනට : අලුත් මාවත පාර, වරිපනම් අංක 626/1 දරන අංක 37A/19710 දරන පිඹුරේ ලොට් B, නිරිතට : ලොට් XA2 (මෙහි තාවකාලික වීදි රේඛාව තුළ ඉඩම), වයඹට : ලොට් XA1 (අනුමත කළ වීදි රේඛාව තුළ ඉඩම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නමයයි දශම පහයි තුනක් (R:1,P:9.53) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 10463 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 06/135 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී අලුත් මාවත පාරේ පිහිටි අලුත් මාවත පාර, වරිපනම් අංක 626 දරන ඉඩමට බලයලත් මානක තැන කේ. සෙල්වරත්නම් යන අය විසින් සාදන ලද 2004 සැප්තැම්බර් 27 දාතම හා අංක 10463 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් XA1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්:- ඊසානට : ගමන් මාර්ගය (අඩි 3 පළල) (මීටර් 0.9 පළල), ගිණිකොනට : මෙහි ලොට් XA, නිරිතට : පාර, වයඹට : අලුත් මාවත පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි බිංදුවක් (P:3.10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 10463 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 143/109 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී අලුත් මාවත පාරේ පිහිටි අලුත් මාවත පාර, වරිපනම් අංක 626 දරන ඉඩමට බලයලත් මානක තැන කේ. සෙල්වරත්නම් යන අය විසින් සාදන ලද 2004 සැප්තැම්බර් 27 දාතම හා අංක 10463 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් XA2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්:- ඊසානට : මෙහි ලොට් XA, ගිණිකොනට: අලුත් මාවත පාර, වරිපනම් අංක 622/1 දරන පරිශ්‍රයන්, නිරිතට : පාර, වයඹට : අලුත් මාවත පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම පහයි බිංදුවක් (P:4.50) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 10463 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 14/110 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

03-02

---

### යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදාන කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හපුතලේ, යහලබැද්ද, "අමරසිරි" යන ස්ථානයේ පදිංචි නවරත්න මුදියන්සේලාගේ උදය කුමාර (ජාතික හැඳුනුම්පත් අංක 792853951V දරන) සහ එම ලිපිනයේම පදිංචි වීරවන්නි මුදියන්සේලාගේ මංජුලා මානෙල් ජයතිලක (ජාතික හැඳුනුම්පත් අංක 787183590V දරන), (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායින්/ උකස්කරුවන්" වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන,) වෙතින් ශ්‍රී ලංකා රුපියල් එක්කෝටියක (රු.10,000,000.00) කාලීන ණය පහසුකමක් (මෙහි මින්මතු 1 වන කාලීන ණය පහසුකම වශයෙන් හඳුන්වන,) සහ ශ්‍රී ලංකා රුපියල් තුන්ලක්ෂ තිස්අටදහස් තුන්සියපනස් දෙකකුත් ශත විසිදෙකක (රු.338,352.22) කාලීන ණය පහසුකමක් (මෙහි මින්මතු 2 වන කාලීන ණය පහසුකම වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායින්/උකස්කරුවන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල් එක්කෝටියක (රු.10,000,000.00) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජයරාණි පීරිස් විසින් සහතික කරන ලද අංක 22743 සහ 2018.12.24 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා ඉහත කී මූල්‍ය පහසුකම් (මෙහි මින්මතු සාමූහික වශයෙන් "එකී මූල්‍ය පහසුකම්"

වශයෙන් හඳුන්වන,) නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු ශ්‍රී ලංකා රුපියල් එක්කෝටියක (රු.10,000,000.00) මුදල සහ ඒ මත පොළිය ගෙවීම පිණිස එකී දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා එකී බන්ධනදායින් /උකස්කරුවන් වෙතින් යුනියන් බැංකුව වෙත මෙහි පහත සඳහන් මුදල් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද, එනම් :

(i) 2021.03.17 වැනි දිනට 1 වන කාලීන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් එක්කෝටි දස ලක්ෂ අසූදහස් පන්සිය එකොළහකුත් ශත අසූඑකක (රු.11,080,511.81) මුදල සහ තව ද, රුපියල් අනූනවලක්ෂ විසිපන්දහස් තුන්සිය අසූදෙකකුත් ශත හැත්තෑඑකක (රු.9,925,382.71) මුල් මුදල මත 2021.03.18 වැනි දින සිට වර්ෂයකට 19% බැගින් තවදුරටත් පොළිය ;

(ii) 2 වන කාලීන ණය පහසුකම මත මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් තුන්ලක්ෂ තිස්අටදහස් තුන්සිය පනස් දෙකකුත් ශත විසිදෙකක (රු.338,352.22) මුදල ;

ඉහත කී ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායින් / උකස්කරුවන් විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් 3 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියාකරමින්, එකී මූල්‍ය පහසුකම් මත එකී බන්ධනදායින්/ උකස්කරුවන් වෙතින් යුනියන් බැංකුව වෙත අයවිය යුතු ඉහත කී මුදල් සහ එකී මූල්‍ය පහසුකම්වල මුල් මුදල මත 2021.03.18 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් අනුපාතවලින් තවදුරටත් පොළිය සහ තව ද, අංක 22743 දරන එකී උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජයරාණි පීරිස් විසින් සහතික කරන ලද අංක 22743 සහ 2018.12.24 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන එකී දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට එල්. බී සේනානායක දේපළ වෙන්දේසිකරුවන් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මැදිකින්ද මහපළාත කෝරළයේ, හපුතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හපුතලේගම ග්‍රාම නිලධාරී වසමේ යහලේබැද්ද ගමේ පිහිටි "ගල්පට්ටියේවත්ත" *නොහොත්* "හපුගහවත්ත"නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. නන්දසේන විසින් මැන සාදන ලද අංක 7509 සහ 2018/01/31 දින දරන මානක පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට (බලයලත් මිනින්දෝරු පී. ඩබ්. නන්දසේන විසින් මැන සාදන ලද අංක 4570 සහ 2003.10.11 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කරන ලද බිම් කැබැල්ලේ නැවත මැන බෙදීමක් වන,) මායිම් :- උතුරට : ඩී. එම්. රත්නපාල බණ්ඩාර සහ එච්. කේ. චන්ද්‍රසේකර යන අය විසින් හිමිකම් කියන ඉඩම් ද, නැගෙනහිරට : එච්. කේ. චන්ද්‍රසේකර යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ පාර ද, දකුණට : දියතලාව පාර ද, බස්නාහිරට : ඩබ්. එම්. සුමනාවතී යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ පාසලේ පිට්ටනිය ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකකුත් පර්චස් දහඅටක් (අ1, ප18) *නොහොත්* හෙක්ටයාර බින්දුවයි දශම හතරයි පහයි බිංදුවක් (හෙක්.0.450) විශාල ඉඩම් කැබැල්ල සහ යහලේබැද්දේ සිට දියතලාව දක්වා වැටී ඇති පාරට සම්බන්ධ වන ප්‍රවේශ මාර්ගයේ මාර්ග අයිතිය ඇතුලුව සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ W/09/138 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-07

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංක පී කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ශාඛාව : කොටිකාවත්ත
ණය ගිණුම් අංකය : 2315630

ඔසඳ මෝටර්ස්

2022 ජනවාරි මස 28 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් සහතික කරන ලද 2017.06.22 දිනැති අංක 3347 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් සහතික කරන ලද 2018.10.04 දිනැති අංක 822 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු

මුදල් ගෙවීමට ණයකරු ලෙසට අංක 238/A 53, ශ්‍රී සුමන මාවත, අංගොඩ හි පිහිටි "ඔසඳ මෝටර්ස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන රාහුල පාර, මුල්ලේරියාව, නව නගරය හි අංක 94/1 හි පදිංචි රොෂාන් ප්‍රසන්න පුංචිහේවගේ උකස්කරු ලෙස ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ (වාරික ණය ගිණුම් අංක 2315630) රුපියල් දහසය මිලියන නමසිය හය දහස් හාරසිය විස්සයි ශත අසූහතරක (රුපියල් 16,906,420.84) මුදලක් 2021 අප්‍රේල් මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාහසය මිලියන නමසිය හය දහස් හාරසිය විස්සයි ශත අසූහතරක (රුපියල් 16,906,420.84) මුදල අයකර ගැනීම සඳහා 2021 අප්‍රේල් මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 11,835,000.00ක මුදලක් මත වර්ෂයකට 16.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් එය ද අඩු කොට එකී අංක 3347 සහ 822 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි බලයලත් වෙන්දේසිකරු එම්. එච්. ටී. කරුණාරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් සම්මත කර ගනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලේ පහළ, අළුත්කුරු කෝරළේ, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 505A මල්පුර ග්‍රාම නිලධාරී වසමේ, වරිපනම් අංක 49, රාහුල පාර, අංගොඩ පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ටී. අබේසිංහ විසින් සාදන ලද 2009.10.27 දිනැති අංක 1693 දරන පිඹුරේ ලොට් 1C වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉහත කී ලොට් 1C දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : (මෙහිම) ලොට් 1A සහ 1B, නැගෙනහිරට : ඒ. පතිරාජට අයත් ඉඩම ද, දකුණට : (මෙහිම) ලොට් 1D ද සහ බටහිරට : කේ. ඒ. තිලකරත්නට අයත් ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම හතයි පහක් (පර්.9.75) විශාල ඉඩම එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලුම දේ සමග වේ. මෙකී අංක 1693 දරන සැලැස්ම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F 117/67 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2022 පෙබරවාරි මස 07 වැනි දින.

03-47

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී

ශාඛාව : ඩුප්ලිකේෂන් පාර
ණය ගිණුම් අංක : 2216088 සහ 2427354

මලිත් යහතුගොඩ

2021 අප්‍රේල් මස 28 වැනි දින පැවැත් වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එම්. එන්. රාජසූරිය විසින් සහතික කරන ලද 2011 මැයි මස 12 දිනැති අංක 488 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩබ්ලිව්. එම්. එම්. එම්. එස්. අමරකෝන් විසින් සහතික කරන ලද 2014 ජූනි මස 09 දිනැති අංක 1095 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බත්තරමුල්ල, පන්නිපිටිය පාරේ අංක 1104/1 හිල්ටොප් රෙසිඩන්ස් හි මලිත් යහතුගොඩ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ (ණය ගිණුම් අංක 2216088 සහ 2427354) රුපියල් මිලියන දහසයයි පන් ලක්ෂ හය දහස් තිස් එකයි ශත එකක (රුපියල් 16,506,031.01) මුදලක් 2021 පෙබරවාරි මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දහසයයි පන් ලක්ෂ හය දහස් තිස් එකයි ශත එකක (රුපියල් 16,506,031.01) මුදල අයකර ගැනීම සඳහා සහ 2021 පෙබරවාරි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 5,456,194.05 මුදලක් මත වර්ෂයකට 14.50% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහ රුපියල් 8,442,000.00ක මුදලක් මත වර්ෂයකට 15% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට අංක 488 සහ අංක 1095 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොලොන්නාව විහාර මාවතේ, අංක 50/3 ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි බලයලත් වෙන්දේසිකරු එම්. එච්. ටී. කරුණාරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ අංක 522, පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වරිපනම් අංක 12 (කොටසක්) ආනන්ද බාලිකා මාවත, පිටකෝට්ටේ පිහිටි මාරගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1981 ජුනි මස 30 වැනි දිනැති අංක 2276 දරන සැලැස්මේ ලොට් 01 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්ඃ උතුරු - නැගෙනහිරට : (පාර සඳහා වෙන් කළ) ලොට් C ද, දකුණු - නැගෙනහිරට : පාර ද, දකුණ - බටහිරට : මෙම ඉඩම් ලොට් 02 ද, උතුරු - බටහිරට : ලොට් D යන මෙකී මායිම් තුළ පිහිටි එකී ලොට් අංක 01 පර්චස් දාහතරයි දශම නවයක් (පර්. 14.9) විශාල ඉඩම් කොටස එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ඇතුලු අනෙකුත් සියලුම දේ සමග වේ. එකී 2276 දරන සැලැස්මේ සටහන් ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 1033/241 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම ඉහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ අංක 522, පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, පිටකෝට්ටේ, ආනන්ද බාලිකා මාවත, 5 වැනි පටුමග, වරිපනම් අංක 12/1A හි පිහිටි මාරගහවත්ත නැමති ඉඩමට (බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1981 ජුනි මස 30 වැනි දිනැති අංක 2276 දරන සැලැස්මේ ලොට් 01 හි නැවත මැනීමක්) බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2011 අප්‍රේල් මස 07 වැනි දිනැති අංක 4339 දන සැලැස්මේ ලොට් 01 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්ඃ උතුරට : ආනන්ද බාලිකා මාවතේ, වරිපනම් අංක 12/1C දරන පරිශ්‍රය සහ පුද්ගලික පාර ද, නැගෙනහිරට : (අඩි 20 පළල ඇති) පුද්ගලික පාර ද, දකුණට : ආනන්ද බාලිකා මාවතේ, වරිපනම් අංක 12/4 පරිශ්‍රය හා අඩි 20 පළල ඇති මාර්ගය ද, බටහිරට : ආනන්ද බාලිකා මාවතේ, වරිපනම් අංක 12/4 පරිශ්‍රය සහ 12/1C යන පරිශ්‍රය යන මෙකී මායිම් තුළ පිහිටි එකී 4339 දරන සැලැස්මේ සඳහන් පර්චස් දාහතරයි දශම නවයක් (පර්.14.9) විශාල ඉඩම එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි ඇතුලු අනෙකුත් සියලුම දේ සමගා වේ.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය ද සමග.

එකී පිටකෝට්ටේ ග්‍රාමයේ පිහිටි මාරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජී. සී. ඩයස් විසින් සාදන ලද 1978 මාර්තු මස 02 දිනැති අංක 1348 දරන සැලැස්මේ ලොට් F (පාර සඳහා වෙන් කිරීමක්) ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරු - නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1953 පෙබරවාරි මස 14 දිනැති අංක 440 දරන සැලැස්මේ ලොට් 01 ලෙස දක්වා ඇති දැන් එච්. ඒ. පෙරේරා සතු ඉඩම ද, දකුණු - නැගෙනහිරට : වනිගසූරිය සහ වෙනත් අයට අයත් ඉඩම, දකුණු - බටහිරට : ආනන්ද බාලිකා මාවත, කලින් 5 වැනි පටුමග ලෙස සඳහන්, උතුර - බටහිරට : ලොට් E, D සහ ලොට් C (අඩි 10ක් පළල ඇති පාර සඳහා වෙන් කළ) සහ අංක 440 දරන සැලැස්මේ සඳහන් ලොට් 02 හා 03 යන මෙකී මායිම් තුළ පිහිටි එකී 1348 දරන සැලැස්මේ සඳහන් ලොට් F පර්චස් විසිතුනයි දශම හයක් (පර්.23.6) විශාල ඉඩම නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 2469/213 යටතේ ලියාපදිචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

දිනය : 2021 ජුනි මස 14 වැනි දින.

03-48

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **මාර්තු** | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2022.05.06 | සිකුරාදා | 2022.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.13 | සිකුරාදා | 2022.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.20 | සිකුරාදා | 2022.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.27 | සිකුරාදා | 2022.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.